## කෙටි කාලීන වීසා අයදුම්පත් සමග ඉදිරිපත් කළයුතු තොරතුරු
## (2012.04.01 දින සිට වලංගු වන පරිදි)

වීසා අයදුම්පත සඳහාන් තානාපති කාරයාලයේ වෙබ් අඩවියෙන් බාගතකළ යුතුවේ.
**http://www.mofa.go.jp/j_info/visit/visa/pdfs/application1.pdf**

**වීසා අයදුම්පත සම්පූර්ණ කළයුතු ආකාරය**

1. වීසා අයදුම්පතෙහි ඉල්ලා ඇති විස්තර සියල්ලම සම්පූර්ණයෙන් සැපයිය යුතුයි.
2. අදාල විස්තර සත්‍ය හා නිවැරදි තොරතුරු විය යුතුයි.
3. කෙටි කාලීන සංචාරයක් වීසා ලබා ගත හැකි උපරිම කාල සීමාව දින 90 කි.
4. දින 90 ක උපරිම කාල සීමාව නොඉක්මවා ජපානයේ සංචාරය කිරීමට අවශ්‍ය කාල සීමාව අයදුම්කරු තීරණය කළ යුතුවේ.
5. වීසා අයදුම්පත පැහැදිලිව ටයිප් කර හෝ ලොකු අකුරෙන් සම්පූර්ණ කළ යුතුවේ.
6. කුඩා දරුවන් ඇතුළුව සෑම අයදුම්කරුවෙකුම වීසා අයදුම්පතක් සම්පූර්ණ කළ යුතුවේ.

**සෑම අයදුම්කරුවෙකුම විසින්ම සැපයියයුතු තොරතුරු**

1. පළමුවරට ජපන් වීසා අයදුම් කරන අයදුම්කරුවන් තම උප්පැන්න සහතිකයේ මුල්පිටපත හා ඡායා පිටපතක් හා එම අයගේ නම කිසි දිනෙක වෙනස් කර නොමැති බව ප්‍රතිඥා කෙරෙන දිවුරුම් ප්‍රකාශනයක් ඉදිරිපත් කළ යුතුයි.
2. විවාහක අයදුම්කරුවන තම විවාහ සහතිකයේ මුල්පිටපත හා ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතුයි.
3. යාමට හා ආපසු ඒම සඳහා ස්ථිර කළ සංචාර ඒජන්සියෙන් නිකුත් කළ ලිපිය (ගුවන් ගමන් බලපත්‍ර සඳහා ගෙවූ මුදල ආපසු ලබාගැනීම පිළිබඳව තානාපති කාරයාලයේ වගකීමක් නොමැත.)
4. පසුගිය මාස 6 ඇතුලත ගත් ඡායා රූපයක් (ඡායා රූපයේ ප්‍රමානය පිළබඳ දැනගැනීම සඳහා වීසා අයදුම්පත බලන්න)
5. වලංගු ගමන් බලපත්‍රයක් සහ ඇතිනම් අවලංගු වී ඇති අනිකුත් ගමන් බලපත්‍ර.

6 ජාතික හැඳුනුම්පත හා පැහැදිලි ඡායා පිටපතක්

ජාතික හැඳුනුම්පත පැහැදිලි නැතිනම් හෝ පලුදුවී ඇත්නම්, අලුත් හැඳුනුම්පතක් ඉදිරිපත් කළ යුතුයි.

7 ජපානයෙ අධ්‍යාපනය හැදෑරමට වීසා අයදුම් කරන අයදුම්කරුවන් තම පාසලේ ප්‍රධානියා නිකුත් කරනු ලබන අධ්‍යාපන සහතික මුල්පිටපත් ඉදිරිපත් කළ යුතුයි.

**ව්‍යාපාරික සංචාරයක් සඳහා ඉදිරිපත් කළයුතු තොරතුරු**

1. අදාල ව්‍යාපාරයෙන් ලිපියක් (සංචාරයට හේතු, කාලසීමාව සහ ජපානයේ ව්‍යාපාරික කටයුතු වල නිරත වීමට බලාපොරොත්තු වන, ජපානයේ ව්‍යාපාරයේ විස්තර ඇතුලත් විය යුතුයි.)
2. ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ මුල්පිටපත හා පැහැදිලි ඡායා පිටපතක්

3 ව්‍යාපාරයේ ඉකුත් මාස 6 ක බැංකු ගිණුම් විස්තරයේ මුල් පිටපත් (ස්ථිර තැන්පත් ගිණුම් විස්තර භාරගනු නොලැබේ)

4. ඉකුත් බදු ගෙවීමේ කුවිතාන්සියේ මුල් පිටපත.
5. ජපානයේ ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ මුල්පිටපත හා එම ව්‍යාපාරයෙන් ලැබී ඇති ඇපවීමේ ලිපියේ මුල් පිටපත (ජපානය තුලදී සියලුම වියදම් ජපානයේ ව්‍යාපාරයෙන් දරන්නේ නම් පමණක් ඇපවීමේ ලිපිය ඉදිරිපත් කළ යුතුයි.)

**ජපානයෙන් ලැබෙන ලියකිවිලි මුල්පිටපත්, කුරියර්/තැපෑලෙන් ලැබූ ලිපිකවරය සමග ඉදිරිපත් කළ යුතුයි.**

**<u>සංචාරයක් හෝ ඥාතීන් හමුවීමට හෝ සම්මේලනයකට සහභාගි වීමට ඉදිරිපත් කළයුතු තොරතුරු</u>**

1. අයදුම්කරුගේ ඉකුත් මාස 6 යේ පෞද්ගලික බැංකු ගිණුම් විස්තරයේ මුල් පිටපත් (ස්ථිර තැන්පත් ගිණුම් විස්තර භාරගනු නොලැබේ.)
2. වෘතිය සහතිකයක් හෝ ව්‍යාපාරිකයෙකු නම් ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ මුල්පිටපත හා පැහැදිලි ඡායා පිටපතක් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට නම් පාසලේ හෝ ආයතන ප්‍රධානියාගෙන් ලිපියක් (හෝ අදාල සහතික)
3. ජපානය තුලදී අයදුම්කරුගේ සංචාරක විස්තරය.

- රට නැරඹීමට නම් යෝජිත චාරිකාවේ ගමන් විස්තර හා පැක්ස් මගින් පමණක් ගත් හෝටල් කාමර වෙන්කිරීමේ කුවිතාන්සිය
- ඥාතීන් හමුවීමට නම ඥාතීන් පිලිබඳ විස්තර හා යෝජිත ගමන් විස්තරය.
- ඥාතියා හෝ මිතුරා ජපන් ජාතික නම් එම අයගේ වෘතීය සහතිකය, පදිංචිය පිලිබඳ සහතිකය හා ආදායම් සහතිකය
- ඥාතියා හෝ මිතුරා ශ්‍රී ලාංකිකයෙකු නම් එම අයගේ ඒලියන් කාඩ්පතේ පිටපතක්, ඒලියන් රෙජිස්ට්‍රේෂන් සහතිකය, ජපානයේ නගර සභා කාරයාලයෙන් නිකුත් කරනු ලබන එම අයට ජපානයේ රැඳීසිටීමට ඇති වීසා බලපත්‍රයේ සහ එම ගමන් බලපත්‍රයේ පිටපත් (ඡායා රූපය අඩංගු පිටපතද ඇතුළුව)

4 චාරිකාවක නිරත අයනම් චාරිකාවේ විස්තර අඩංගු චාරිකා පත්‍රිකාව

5 රැස්වීමකට හෝ සම්මේලනයකට හෝ සහභාගි වන අයනම් අදාල තොරතුරු සහිත පත්‍රිකාව හා හෝටල් කාමර වෙන්කිරමේ කුවිතාන්සිය සහ අයදුම්කරු ඉදිරිපත් කරන වෙනත් අදාල තොරතුරු.

**ජපානයෙන් ලැබෙන ලියකිවිලි මුල්පිටපත්, කුරියර්/<u>තැපෑලෙන් ලැබූ ලිපිකවරය සමග</u> ඉදිරිපත් කළ යුතුයි.**

**<u>සැලකිය යුතුයි.</u>**

1. සියලුම ලියකියවිලි සත්‍ය ලියකියවිලි විය යුතුයි. ව්‍යාජ ලියකියවිලි හෝ අයදුම්පතෙහි අසත්‍ය තොරතුරු ඉදිරිපත් කරන අයදුම්කරුවන්ට කිසිදිනෙක ජපානයට ඇතුල්වීමට අවසර නොලැබෙනු ඇත.

2. ඉහත සඳහන් ලියකියවිලි වීසා අයදුම්පත් භාරගැනීම සදහා පමණි. එම ලියකියවිලි භාරගත් පමණින් වීසා බලපත්‍ර නිකුත් කරනු නොලැබේ. ඊට අදාල වෙනත් ලියකියවිලි ඉල්ලුම් කිරීමට වීසා බළධරීන්ට සිදුවිය හැක.

3. වීසා අයදුම්පත් සඳුදා සිට සිකුරාදා දක්වා පෙරවරු 9.00 සිට 10.30 අතර භාරගනු ලබන අතර වීසා තීරණය කිරීමට වැඩකරන දිනයන් 5 ක් ගතවේ.

4. වීසා බලපත්‍ර සඳුදා, සිට සිකුරාදා දක්වා පස්වරු 3.00 සිට 4.30 දක්වා නිකුත් කරනු ලැබේ.

5. වීසා බළධරීන්ගේ අභිමතය අනුව වීසා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කළ හැකිවේ.

6. වීසා බලපත්‍ර සඳහා රු. 4,110/- මුදලක් අයකෙරේ. දෙමව්පියන්ගේ ගමන් බලපත්‍රයේ ඇතුළත් ළමුන් සඳහාද එම මුදලම අයකෙරෙනු ලැබේ. නියම කළ මුදල පමණක් ගෙවීමෙන් අයදුම්කරුවන්ට සිදුවන අපහසුතා මගහරවා ගතහැක.

වීසා නිළධාරි ජපන් තානාපති කාරයාලය.